## හොරු හොරු හොරු

ගෙදර නැතත් හොරු කඩනවා, හිටියත් කඩනවා. කාර් පාක් කරලා තිබුනත් අරන් යනවා ඩ්‍රයිව් කරන් යනකොටත් නවත්තලා බලෙන් අරන් යනවා. දැං අළුත්ම තත්වේ ඒකයි. මෙල්බනුත් දැං ඉතාලියේ සිසිලිය වගේ. නිදහසේ ඉන්න බැරි තත්වයක් දැං උදාවෙලා තියෙන්නෙ. පොලිසිය මොකද කරන්නේ එනවා පැමිනිලි ලියා ගන්නවා. යනවා. හොරෙකුට හරි මැරයෙකුට හරි ගහල අතවරයක් කලොත් හෙ-ාරාට නෙවෙයි ලෙඩේ. හොරාට ගහපු මිනිහටයි ලෙඩේ. මේකට තමයි ප්‍රජාතන්ත්‍රවාදය හා මානව හිමිකම් වල විහිළු සහගත පැත්ත.



මේ අළුතින් ඇතිවෙලා තියෙන තත්වයට පුරවැසියන් වශයෙන් අපට තනි තනිව කළ හැකි දෙයක් නැහැ. නීතිය සහ පොලිසිය හුදෙකලා සිද්ධිවලට දක්වන උණන්දුව අඩුයි. ඔවුන් පවසන්නේම පාඩුව හා අලාභය රක්ෂණය හරහාම ලබාගත හැකි බවයි. එය සත්‍යයක් වුනත් මේ සමාජ උවදුර පැතිරීම වැලැක්වීමට අපි සංවිධාන ගත වීමක් අවශ්‍යව වෙන බව මගේ නම් හැඟීමයි. කණ්ඩායමකට හෝ සංවිධානයකට හෝ මෙහි කළ හැකි බලපෑම සුවිසල් අපි යොමු විය යුත්තේ එයටයි. චූටි මල්ලිට දැන ගන්න ලැබුනු විදියට මේ කාර් පැහැර ගැනීම්වලට එරෙහි වීම සඳහා දන්න කියන කීප දෙනෙක් සූදානම් වෙනවා තනි තනිවම ප්‍රචන්ඩ ආකාරයෙන් පිළිතුරු දෙන්න. ආත්මආරක්ෂාව හොඳයි ඒත් යුද්ධයකින් පසු ඇතිවන තත්වයට මුහුන දෙන්න ගියාම තමයි අවුල. අමාරුයි තමයි. ඒත් මේක දැන් සීඝ්‍ර ලෙස පැතිරෙමින් තියෙනවා. ඒකට අපි සූදානම් වෙමු. සංවිධාන ගත වෙමු. තනි තනියෙන් නොවෙයි තමන් පදිංචි කෝට් එක, ස්ට්‍රීට් එක, රෝඩ් එක විදියට

## අපේ කම රැකගැනීම

ඊයේ විශ්ව නර්තනායතනයේ නැටුම් ප්‍රසංගය බලන්න ගියා. මෙල්බර්න් වල විවිධ නැටුම් කණ්ඩායම් තියෙනවනේ. ඒ හැම එකකම දක්ෂ ශිල්පීන් ශිල්පි නියන් ඉන්නවා. ඇත්ත වශයෙන්ම සමහර මෙහේ ඉපදුන ලමයි ලංකාවේ ශිල්පීන්. අභිභවා යන තරම්.



මේ හැම ප්‍රසංගයකදීම අපි හැමෝම ලබන්නේ නොමද ආශ්වාදයක්. ඊයේ ෂෝ එක බලල එද්දි මට මේ ළමයි ගැන ඇති වුනේ හරි භක්තියක්. ඒ භක්තියේ ගෞරවය හිමි විය යුත්තේ මේ නැටුම් ආචාර්යවරුන්ට. ඒකට හේතුව මම දකින්නේ මේ විදියට. අපි හැමදාම හැමතැනම අපේ රට ගැන ආගම ගැන සංස්කෘතිය ගැන කතා කරනවා වාද කරනවා වර්ණනා කරනවා. යම් යම් ක්‍රියාකාරකම් කරනවා. ඒත් ඇත්තටම හිතලා බැලුවොත් මේ කරන ක්‍රියාකාරකම්වලින් අපේ සංස්කෘතිය ආරක්ෂා වෙනවාද ඉදිරියට ගෙන යාමක් සිදුවෙනවද මේ නැටුම් පංතියකින් තරම්.

අප අපේ සංස්කෘතිකාංග විදියට අවුරුදු උත්සව වෙසක් උත්සව පවත්වනවානම් මේ හැම එකකම බොහෝ විට එක දවසකට සීමා වූ ක්‍රියා. අපි හැමෝම ඒවාට සහභාගි වෙනවා කනවා බොනවා චාරිත්‍ර කරනවා යනවා ආපහු පහුවෙනිදා ඉඳලා අපි නෝමල්. ඒත් මේ නැටුම් පංතිවලදි ඔවුන් ඒ ජීවිතේ යම් කාලයක් නොකඩවා පුහුණුවීම් වල යෙදෙනවා. සමහරවිට ඔවුන් වසර පහ හය සිට දහය දක්වා කාලයක් අපේ සංස-"කෘතිය තුල ජීවත් වෙනවා. ඔවුන් ගීත නැටුම්, වාදන, නාඩගම්, වන්නම් තුල ජීවත් වෙනවා. ඒවා ඉගෙන ගැනීම් නවීක-රණය



කරමින් ඉදිරියට ගෙනයනවා නො-වේද ?

පහුගිය දශක දෙකක කාලය තුළ කොතරම් ළමුන් ප්‍රමාණයක් විවිධ නැටුම් ගුරු-වරුන් යටතේ අපේ සංස්කෘතිය තුල ජීවත් උනාද? යම් කොටසක් යම් කාලයක් තුළ අවසන් කරන කොට තවත් කොටසක් ඒ කෙෂ්ත්‍රයට අතුලත් වෙලා. නිකමට හිතලා බලන්න. වෙන එකම සංස් කෘතික ක්‍රියාකාරකමක් තුලවත් මේ අන්දමින් සමාජ අනුගතවීමක් නොවෙද කියල.. ඒ ගුරුවරු යම් ඉපයීමක් කරන බව සත්‍යයක්. ඒත් ඔවුන් මේ කරන ක්‍රියාව නම් අගැයිය යුතුමයි. සංස්කෘතිය වෙනස් නොවුනොත් එය එකතැන පල්වෙනවා. එයින් මුදවාගෙන මේ කරන සේවාවට චූටි මල්ලිගේ දහ අට වංගුවෙන් රසිකා අක්කට මෙන්න මල් මිටක්.......

## හැකරා සහ අනුකම්පාව

ජනාධිපතිතුමාගේ වෙබ් අඩවිය ආක්‍රමණය කරපු කොල්ලො දෙන්න සම්බන්ධයෙන් සමහර අයගෙ මතය නම් හරිම අපූරුයි. ඒ අය කියන්නෙ හැක-රුන් දෙන්නට හොඳට සලකලා ජොබ් එකක් දෙන්න ඕන කතාවක්. මාරයි. ජනතාවගේ දැනුමට අබ සරණයි කියලා තමයි මට නම් කියන්න වෙන්නේ.




හැම මිනිහෙක්ම වගේ මේ ක්‍රියාවේ තියෙන බරපතල තම අමතක කරලා ඒක දේශපාලන කාරණාවක් ලෙස ගැනීම ගැන ඇති වන්නේ මාර කණගාටුවක්.

හැක් කරනවා කියන්නේ මාර වැඩක් කියලා තමයි බොහෝ දෙනා හිතාගෙන ඉන්නේ. පරිගණක තාක්ෂණේ හදුනන කෙනෙකුට වෙන වැඩක් නැත්නම් කරන්න පුළුවන් වැඩක් තමයි ඒක කියලා දන්නේ කීයෙන් කී දෙනාද. සරලව කිව්වොත් මෙ-හෙමයි. හරි වත්තකට ඇතුල් වෙන්න බැරි වෙන්න වැටක් ගහල තියෙනවා කියලා හිතන්න. බොහෝ දෙනා කරන්නේ වැට ළඟට ඇවිත් අතගාල බලලා පනින්න කඩන්න බැරි නිසා හැරිලා ගිහින් වෙනත් ක්‍රමයක් හොයන එකනේ. ඒත් මීයෙක් එහෙම කරනවාද. ඌ ඒ වැට දිගේ හොයාගෙන හොයාගෙන ගිහින් පුංචි හිලකින් හරි රිංගන්න බලනවා. අන්න ඒ පුංචි හිල හොයාගන්න එක තමයි හැකර්ලා කරන්නේ. අනුන්ගේ මගුල් හෙ-ායන්න වෙන වැඩක් නැති එවුන් ඕවා කරනවා. අපි ඕනෙම රෙද්දක් ඔළුව උඩ තියාගන්නවා. අනික් කාරණය නම් පරිගණක ඕස්තාර්ලා කියන විදියට ලංකාවේ පරිගණක අඩවි වල ආරක්ෂණයත් අන්තිම ප්‍රාථමිකයි. දැං කී දෙනෙකුගේ අඩවි වලට හැකර්ලා කඩා පැන්නද? අවංකව ගත්තොත් මේක නැවැත්විය යුතු දඬුවම් කළ යුතු වරදක්. හොරකම කියන එක ගොන් විදියට කළත් සූක්ෂමව කළත් හොරකමමයි. ලෝකේ දිහා බැලුවොත් මෙයට වඩා සූක්ෂම වැඩ කරපු හොරුන්ටත් දඬුවම් දීලා තියෙනවා. ඒ නිසා මේ හොර වැඩ වීරත්වයට නංවන මා-නසිකත්වයෙන් අප මිදෙන්න ඕනේමයි.

## සුනාමි? ඒ මොකක්ද?

ඊයේ පෙරේදා නවසීලන්තය පැත්තේ ඇතිවුන භූමි කම්පාවකින් සුනාමි ආපදාවක් මතුවිය හැකි බවට කළ අනතුරු ඇඟවීමකදී ඒ රටේ වෙරළ ආසන්න ජීවත් වුන මිනිසුන්ව ක්ෂනිකව ඉවත් කලා. ඒ සම්බන්ධව තොරතුරු ඔබ සියළු දෙනා දකින්නත් ඇති මොන තරම් කෙටි කාලසීමාවක් තුල ක්‍රමානුකූලව කළ වැඩ පිළිවෙල නිසා සුනාමියක් ආවත් වෙන්න තිබුන අනතුරෙන් ඔවුන් මිදෙන තත්වයක් එතන තිබුනේ.

ඒ සමගම මට සිහි වුනේ අපේ රට. අනේ අපොයි ආපසු සුනාමියක් ආවොත් මොකද වෙන්නේ කියලා. දැං කාටද ඒක මතක. මොනතරම් නීති රීති පැනවුවද.. ආරක්ෂන



ක්‍රියා මාර්ග අරම්භ කළාද ..මොනවද දැං ඒවයින් ක්‍රියාත්මක වන්නේ. කාටද ඒවගේ වැදගත් කමක් තියෙන්නේ. ජනතාවටද පාලකයන්ටද ?

මාරයි අප්පා අපේ රට. ඉතිං ප්‍රභාකරන් වැරදිද ?

## වියට්නාමය සහ ඔස්ට්‍රේලියාව

යුද්ධය කියන්නේ බොහෝ දෙනෙකු අකමැති ටික දෙනෙකුගේ අවශ්‍යතාව මත සිදුවන දෙයක් බව ඒවයේ මුල හොයාගෙන ගියහම අහුවෙනවා. ගිනි පුළිඟුවකින් ඇතිවෙන මහා ගිනි ජාලාවක් වගේ ඒවා පැතිරිලා යන්නේ ඊට පස්සේ එකතු වෙන පාර්ශව හින්දයි. මේ නිසා බොහෝ වෙලාවට රටවල් වලට තවත් රටකට එරෙහිව යන්න සිද්ධ වෙන්නේ තමන්ට කෙලින්ම සිදුවන තර්ජන ආක්‍රමණ නිසාම නෙ-වෙයි. අනුන්ගේ අවශ්‍යතාව ඉටු කරන්න බැඳීම් ඇති කරගෙන ඇති නිසා බව ලෝක යුද්ධවල ඉතිහාසය සාක්ෂි දරනවා. නේටෝ, වෝර්සෝ ගිවිසුම් කියන්නේ ඒවලට උදාහරණ.

ලෝක යුද්ධවල මිත්‍ර පාක්ෂික සේනා හැදිලා තිබුනෙත් එහෙම තමයි. ඒකනේ අපි ලංකාවෙනුත් ජර්මනියට එරෙහිව යුද්ධ කරන්න බ්‍රිතාන්‍ය වෙනුවෙන් හමුදාව යෙදෙව්වේ.

අපට මතක මෑත අතීතයේ සිදුවන වියට්නාම් කොරියන් යුද්ධ උනත් එහෙම තමයි. ඉරාකයට ගහපු ඇමරිකන් හමුදාවලට සහය දක්වපු අනෙක් රටවල්වලට සදාම් කරපු වරද මොකක්ද? එහෙම තමයි යුද්ධ වෙන්නේ. හැබැයි ඉතිං යුද්ධ වෙනකොට යුද්ධ නොකරම බැරි වෙලාවලුත් තියෙන බව චූටි මල්ලි පිළිගන්නවා.

මේ හදිසියේ යුද්ධ ගැන කථාකලේ ඕස්ට්‍රේලියාවත් සම්බන්ධ කාරණායක් ගැන



කියන්න. මම මෙහේ ගොඩක් දේවල් අගයනම්, ඒවට සහ පල කරනවා. ඒවා වෙනුවෙන් පෙනී සිටිනවා වගේ අඩුපාඩුවක් වරදක් විවේචනය කරන්න ඊට එරෙහි වෙන්නෙත් පසුබට වෙන්නේ නැහැ.

කතන්දරේ මේකයි. දැං වියට්නාම් යුද්ධය මතකනේ ඇමරිකාව වියට්නාමයට විරුද්ධව කළ යුද්ධයට ඕස්ට්‍රේලියාව හමුදාමය සහයක් දුන්න-නේ.. කොච්චර බලවත් උනත් ඇමරිකාවට අන්තිමට අකුලන් යන්න උනානේ. දැං ඒවා වෙලා සෑහෙන කල් රටවල් දෙකේම සංස්කෘතිය ආර්ථික උපාය මාර්ග හෙම වෙනස් වෙලා පෙරට වඩා කිට්ටු වෙලානෙ ඉන්නේ.

මේ හදිස්සියේ ඕස්ට්‍රේලියාව ඕන වෙලා තියෙනවා මේ වියට්නාම් යුද්ධෙදි මියගිය ඔසී සෙබළුන් සමරල එහේ උත්සවයක් තියන්න. දැං ඒකට ඉඩ දෙන්න බැහැ කියලා වියට්නාමය කියලා. ඒකට තමයි අවුල.. මාර වැඩක්නේ යකෝ අනුන්ගේ සීනි කිරන්න ගිහිල්ලා තරාදිය කඩා ගත්තට කවුද පලි? මොලේ කළඳක් හරි තියෙනවා නම් ඔය වගේ දේවල් කරනවද. රට පොඩි උනාට උන්ටත් ආත්ම ගරුත්වයක් නැද්ද? මේව නම් මහ ගොන් පාට්.

තමන්ගෙ මිනිසුන් මරපු එවුන්ට තමන්ගෙම රටට ඇවිත් සැමරුම් උත්සව තියන්න අවසර දෙන්නෙ මොන යකාද?

අන්තිමට වියට්නාමය බොහොම ඉවසිලිවන්ත විදියට සෙබලුන් සමරන්න ඉඩ දීලා තියෙනවා.. උත්සව නැතිව.. සහෝදරත්වය, විසසවාදී බව රාජ්‍ය තාන්ත්‍රිකභාවය කියන්නෙ අන්න ඒවට තමයි. ප්‍රශ්න විසඳන ක්‍රමය ඥානාන්විත නිසාම තමයි මේවන කොට යුද්ධය නිසාම කුඩුපට්ටම් උන දේශයක් ආර්ථික වශයෙන් ඉදිරියට ඇවිත් තියෙන්නේ ආසියවෙම. නිකමට වගේ ඉතිහාසය නොදරන අයට මතක් කරල දෙන්න ඕනේ ඕස්ට්‍රේලියාව ඇමරිකාවට සහ දුන්න මේ යුද්දෙදි කැලෑවල ගරිල්ලා සටන් කරපු වියට්කොංවරු මරන්න දෙවැනි ලෝක යුද්දෙදි හෙලු බෝම්බ ප්‍රමාණය එක දවසෙදි වියට්නාමයට දැමීමය කියන කාරණාව. සමූල ඝාතනය කොයි තරම් ප්‍රමාණයක් ද කියලා හිතාගන්න පුළුවන්නේ. එහෙම රටකට ගිහින් මිය ගිය තමන්ගේ සෙබළු සමරන්න උත්සව තියන්න ඉල්ලනේනේ රෙදි ඇඳගෙනද අම්මපා.....

මම
**චූටි මල්ලි**